ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක : 2477424, 2477423, 2477418
ෆැක්ස් : 2346257, 2477739
ඊ-මේල් : dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
| දිනය | 2020 ජූනි මස 01 දින |

## විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය - 2020 මාර්තු

### සමස්ත නිරීක්ෂණ

කොවිඩ්-19 (COVID-19) වසංගතය සහ 2020 වසරේ මාර්තු දෙවන භාගයේ සිට ශ්‍රී ලංකාවේ සමාජ හා ආර්ථික කටයුතු අර්ධ වශයෙන් සීමා කිරීම 2020 වසරේ මාර්තු මාසයේ දී විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වයට බලපා ඇත. සැපයුම් සහ ඉල්ලුම් දාම බිඳ වැටීම හා දේශීය නිෂ්පාදන ක්‍රියාවලීන්ට බාධා ඇති වීම හේතුවෙන් වෙළඳ භාණ්ඩ අපනයන මෙන්ම වෙළඳ භාණ්ඩ ආනයන ද සැලකිය යුතු ලෙස අඩු විය. කෙසේ වෙතත්, අපනයන ඉපැයීම් අඩු වීමට සාපේක්ෂව ආනයන වියදම් විශාල ලෙස අඩු වීමත් සමඟ වෙළඳ හිඟය, 2019 වසරේ එම කාලයට සාපේක්ෂව අඩු විය. ගෝලීය වශයෙන් විදේශ ගමන් සඳහා සීමා පැනවීම සහ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ වසා දැමීම නිසා සංචාරක කර්මාන්තය දැඩි බලපෑමකට ලක් විය. වසංගතයේ බලපෑමට ලක් වූ රටවලින් සංක්‍රමණික සේවා නියුක්තිකයින් නැවත පැමිණීමත්, විදේශයන්හි සිටින සමහර සේවා නියුක්තිකයින්ගේ රැකියා අහිමි වීමත් සමඟ 2020 වසරේ මාර්තු මාසයේ දී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ සැලකිය යුතු ලෙස අඩු විය. කෙසේ වෙතත්, 2020 මාර්තු මාසයේ දී ඒකාබද්ධ ණය පහසුකමෙහි ලැබීම් සමඟ මූල්‍ය ගිණුම ශක්තිමත් විය. 2020 වසරේ මාර්තු මස දෙවන සතිය දක්වා සාපේක්ෂ ලෙස ස්ථාවරව පැවති ශ්‍රී ලංකා රුපියල, 2020 වසරේ අප්‍රේල් මැද භාගය දක්වා සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වූ නමුත්, ඉන් පසුව 2020 වසරේ මැයි මාසය තුළ දී සැලකිය යුතු ලෙස අතිප්‍රමාණය වීමත් සමඟ ස්ථාවර විය.




ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වෙළඳ භාණ්ඩ ක්‍රියාකාරිත්වය පිළිබඳව වැඩිදුර තොරතුරු ඇතුළත් 'මාසික වෙළඳ විවරණිකාව' ප්‍රකාශයට පත් කරනු ලබන අතර එය ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවියෙන් ලබා ගත හැක. සංඛ්‍යාති > ආර්ථික දර්ශක > මාසික වෙළඳ විවරණිකාව යන දිගුවෙන් ලබා ගත හැකිය. https://www.cbsl.gov.lk/si/node/6181

**සංඛ්‍යා සටහන 1: විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශය (අ)**

| කාණ්ඩය | 2019 මාර්තු එ.ජ.ඩො. මිලියන | 2020 මාර්තු එ.ජ.ඩො. මිලියන | වෙනස (%) | 2019 ජන.- මාර්තු එ.ජ.ඩො. මිලියන | 2020 ජන.- මාර්තු එ.ජ.ඩො. මිලියන | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| අපනයන | 1,137 | 656 | -42.3 | 3,156 | 2,650 | -16.0 |
| ආනයන | 1,729 | 1,205 | -30.3 | 4,817 | 4,503 | -6.5 |
| වෙළඳ ශේෂය (ශුද්ධ) | -592 | -549 | | -1,661 | -1,853 | |
| සංචාරක ඉපැයීම් | 461 (ආ) | 135 (ඇ) | -70.8 | 1,396 (ආ) | 956 (ඇ) | -31.5 |
| විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ | 571 | 492 | -13.9 | 1,617 | 1,600 | -1.0 |
| කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ලැබීම් (ශුද්ධ) (ඈ) | -5 | -6 | | -34 | -28 | |
| රාජ්‍ය අංශයේ ලැබීම් (දළ) | 2,583 | 592 | | 3,104 | 821 | |
| භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර | 71 | 4 | | 238 | 83 | |
| දිගුකාලීන ණය | 111 | 88 | | 465 | 238 | |
| ඒකාබද්ධ ණය පහසුකම | - | 500 | | - | 500 | |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර | 2,400 | - | | 2,400 | - | |
| සමස්ත ශේෂය | | | | 912 | 143 | |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, කොළඹ කොටස් වෙළඳපොළ, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

(අ) තාවකාලික
(ආ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2019 වර්ෂය සඳහා සිදු කළ සමීක්ෂණයට අනුව ඇස්තමේන්තු කළ සංචාරකයකු මෙරට ගත කරන සාමාන්‍ය කාලය සහ සංචාරකයකුගේ සාමාන්‍ය දෛනික වියදමට අනුව සංශෝධිතය.
(ඇ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2020 වර්ෂය සඳහා එහි සමීක්ෂණ ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසු මෙම තාවකාලික ඇස්තමේන්තු සංශෝධනය විය හැකිය.
(ඈ) ද්විතීයික සහ ප්‍රාථමික වෙළඳපොළ ගනුදෙනු ඇතුළත් වේ.

## වෙළඳ හිඟය හා වෙළඳ මිල අනුපාතය

- **වෙළඳ ගිණුමේ හිඟය** 2019 වසරේ මාර්තු මාසයේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 592 සිට 2020 වසරේ මාර්තු මාසයේ දී එ.ජ.ඩොලර් මිලියන 549ක් දක්වා පහළ ගිය අතර, ඒ සඳහා අපනයන පහළ යෑමට වඩා වැඩි වටිනාකමකින් ආනයන පහළ යෑම හේතු විය. කෙසේ වෙතත්, සමුච්චිත වශයෙන් සැලකූ විට, 2019 වසරේ පළමු මාස තුන තුළ දී එ.ජ. ඩොලර් මිලියන 1,661ක් වූ වෙළඳ හිඟය 2020 වසරේ පළමු මාස තුන තුළ දී එ.ජ. ඩොලර් මිලියන 1,853ක් දක්වා පුළුල් විය. 2020 වසරේ පළමු මාස තුන තුළ දී වෙළඳ ගිණුමේ හිඟය පුළුල් වීම සඳහා බලපෑ ප්‍රධාන අයිතම රූප සටහන 1 මගින් දැක්වේ.

- මේ අතර, අපනයන හා ආනයන මිල ගණන් අතර අනුපාතය දැක්වෙන **වෙළඳ මිල අනුපාතය** 2020 වසරේ මාර්තු මාසයේ දී පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 25.7කින් ඉහළ ගිය අතර, මේ සඳහා අපනයන මිල ගණන් ඉහළ යෑම සහ ආනයන මිල ගණන් පහළ යෑම හේතු විය.

**රූප සටහන 1: වෙළඳ හිඟය පුළුල් වීම සඳහා දායක වූ ප්‍රධාන අයිතම : 2020 ජනවාරි - මාර්තු (එ.ජ. ඩොලර් මිලියන)**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 2: මාසික වෙළඳ හිඟය (2019 – 2020)**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 3: වෙළඳ මිල අනුපාතය (2019 – 2020)**




මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ අපනයන ක්‍රියාකාරිත්වය

- 2020 වසරේ පෙබරවාරි මාසයේ දී වාර්තා වූ සුළු වර්ධනයට ප්‍රතිවිරුද්ධව යමින් 2020 වසරේ මාර්තු මාසයේ දී **වෙළඳ භාණ්ඩ අපනයන** ආදායම පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 656ක් දක්වා සියයට 42.3කින් සැලකිය යුතු ලෙස පහළ ගියේය. රට තුළ ඇඳිරි නීතිය පැනවීම හේතුවෙන් දේශීය නිෂ්පාදන ක්‍රියාවලියට සහ අපනයන ආශ්‍රිත සේවාවන්ට බාධා පැමිණීම මෙන්ම කොවිඩ්-19 වසංගත තත්ත්වය පැතිරීම හේතුවෙන් දේශීය හා ගෝලීය යන දෙඅංශයේ ම සැපයුම් හා ඉල්ලුම් දාම වෙත බාධා පැමිණීම, අපනයන ආදායමේ මෙම කැපී පෙනෙන අඩුවීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.

- ඒ අනුව, 2020 වසරේ මාර්තු මාසයේ දී කෘෂිකාර්මික, කාර්මික සහ ඛනිජ යන ප්‍රධාන අපනයන කාණ්ඩ සියල්ලෙහි අඩුවීම් වාර්තා විය. රෙදිපිළි හා ඇඟලුම්, තේ, රබර් නිෂ්පාදිත, මැණික් දියමන්ති හා ස්වර්ණාභරණ, යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ, මුහුදු ආහාර සහ පොල් වැනි ප්‍රධාන අපනයන නිෂ්පාදිත අඩු වීම, අපනයන ආදායම අඩුවීමට ප්‍රධාන වශයෙන් දායක විය. කෙසේ වෙතත්, මෙම මාසයේ දී සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත අපනයන ආදායමෙහි වර්ධනයක් වාර්තා විය.
- 2020 වසරේ මාර්තු මාසයේ දී අපනයන පරිමා දර්ශකය සියයට 45.1කින් පහළ ගිය අතර, අපනයන මිල දර්ශකය සියයට 7.3කින් ඉහළ ගියේය. මෙමගින් 2019 වසරේ මාර්තු මාසයට සාපේක්ෂව අපනයන පහළ යෑම සඳහා අපනයනය කරන ලද පරිමාව පහළ යෑම මුළුමනින්ම හේතු වූ බව පිළිබිඹු වේ.

**රූප සටහන 4: මාසික අපනයන ක්‍රියාකාරිත්වය**




මූලය: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 5: අපනයන පරිමා දර්ශකය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 2: වෙළඳ භාණ්ඩ අපනයන ආදායම (අ)**

| කාණ්ඩය | 2019 මාර්තු (එ.ජ. ඩොලර් මිලියන) | 2020 මාර්තු (එ.ජ. ඩොලර් මිලියන ) | වෙනස (%) | 2019 ජන.- මාර්තු (එ.ජ. ඩොලර් මිලියන) | 2020 ජන.- මාර්තු (එ.ජ. ඩොලර් මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. කාර්මික අපනයන** | **898.4** | **531.5** | **-40.8** | **2,494.3** | **2,134.1** | **-14.4** |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 47.3 | 38.1 | -19.3 | 135.9 | 110.3 | -18.9 |
| සත්ත්ව ආහාර | 8.7 | 5.8 | -33.6 | 35.3 | 25.4 | -28.0 |
| රෙදිපිළි හා ඇඟලුම් | 532.7 | 312.7 | -41.3 | 1,474.2 | 1,254.9 | -14.9 |
| එයින් ඇඟලුම් | 494.8 | 294.1 | -40.6 | 1,373.3 | 1,163.9 | -15.2 |
| රෙදිපිළි | 28.1 | 12.6 | -55.3 | 74.4 | 64.9 | -12.7 |
| වෙනත් රෙදිපිළි සැකසුම් | 9.8 | 6.0 | -38.9 | 26.5 | 26.1 | -1.8 |
| රබර් නිෂ්පාදිත | 82.6 | 54.5 | -34.1 | 233.0 | 196.2 | -15.8 |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 32.1 | 8.6 | -73.3 | 83.3 | 54.6 | -34.5 |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 39.0 | 21.1 | -45.8 | 108.0 | 86.4 | -20.0 |
| ප්‍රවාහන උපකරණ | 10.0 | 3.6 | -63.8 | 26.0 | 17.7 | -31.8 |
| ඛනිජ තෙල් නිෂ්පාදිත | 48.0 | 37.0 | -22.9 | 124.0 | 177.7 | 43.2 |
| රසායනික නිෂ්පාදිත | 16.4 | 9.6 | -41.1 | 44.5 | 37.7 | -15.1 |
| දැව හා කඩදාසි නිෂ්පාදිත | 12.6 | 5.3 | -58.0 | 40.1 | 26.5 | -33.9 |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 4.2 | 2.9 | -30.4 | 11.1 | 10.7 | -3.6 |
| සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 9.6 | 3.7 | -61.4 | 33.2 | 16.6 | -50.1 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 6.8 | 3.5 | -49.1 | 19.0 | 15.0 | -21.0 |
| මූල ලෝහ හා උපාංග | 17.8 | 6.7 | -62.5 | 47.2 | 31.5 | -33.2 |
| පිඟන් මැටි නිෂ්පාදිත | 2.4 | 1.3 | -43.7 | 7.1 | 6.1 | -14.6 |
| වෙනත් | 28.3 | 17.0 | -39.7 | 72.3 | 66.8 | -7.7 |
| **2. කෘෂිකාර්මික අපනයන** | **232.3** | **122.7** | **-47.2** | **647.7** | **506.5** | **-21.8** |
| තේ | 125.9 | 62.5 | -50.3 | 347.2 | 270.1 | -22.2 |
| රබර් | 3.2 | 1.4 | -58.2 | 8.4 | 7.2 | -14.0 |
| පොල් | 34.8 | 19.7 | -43.4 | 87.8 | 70.4 | -19.8 |
| කුළුබඩු | 24.2 | 12.9 | -46.6 | 80.6 | 51.0 | -36.7 |
| එළවළු | 3.0 | 1.8 | -38.7 | 8.1 | 6.8 | -15.6 |
| සකස් නොකළ දුම්කොළ | 3.5 | 1.0 | -70.0 | 7.5 | 4.4 | -40.9 |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 9.5 | 10.5 | 10.5 | 27.2 | 39.6 | 45.5 |
| මුහුදු ආහාර | 28.2 | 12.8 | -54.8 | 80.9 | 57.0 | -29.6 |
| **3. ඛනිජ අපනයන** | **4.5** | **1.0** | **-77.2** | **9.1** | **4.9** | **-46.0** |
| **4. වර්ග නොකළ අපනයන** | **1.7** | **1.1** | **-31.2** | **5.0** | **4.2** | **-17.2** |
| **මුළු අපනයන** | **1,136.9** | **656.4** | **-42.3** | **3,156.1** | **2,649.7** | **-16.0** |

(අ) තාවකාලික

මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්, ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය

- **වෙළඳ භාණ්ඩ ආනයන** වියදම 2019 වසරේ දෙසැම්බර් මාසයේ සිට වාර්තා වූ ඉහළ යෑමේ ප්‍රවණතාවට ප්‍රතිවිරුද්ධව යමින් 2020 වසරේ මාර්තු මාසයේ දී පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 1,205ක් දක්වා සියයට 30.3කින් සැලකිය යුතු ලෙස අඩු විය. අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩ සඳහා ප්‍රමුඛත්වය ලබා දෙමින් ශ්‍රී ලංකා රේගුව විසින් අනුගමනය කළ තෝරාගත් ආනයන නිෂ්කාශනය කිරීමේ ක්‍රියාවලිය සහ රට තුළ ඇඳිරි නීතිය පැනවීම හේතුවෙන් ආනයන ආශ්‍රිත අනෙක් සේවාවන්ට බාධා පැමිණීම, ගෝලීය සැපයුම් සහ සේවා පහසුකම් දාමයන්ට බාධා පැමිණීම, කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් භාණ්ඩ මිල ගණන් පහළ යෑම ආනයන වියදමෙහි මෙම පෙර නොවූ අඩු වීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. මෙයට අමතරව රථවාහන සහ අත්‍යවශ්‍ය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයනයට පහසුකම් සැපයීම නැවැත්වීම ඇතුළුව කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් විනිමය අනුපාතිකය මත වූ පීඩනය ලිහිල් කිරීම සහ මූල්‍ය වෙළඳපොළ අර්බුදකාරී තත්ත්වයක් ඇතිවීම වැළැක්වීම සඳහා රජය සහ මහ බැංකුව විසින් 2020 වසරේ මාර්තු මාසයේ දී ක්‍රියාත්මක කළ කඩිනම් ක්‍රියාමාර්ග ද ආනයන වියදමෙහි මෙම අඩුවීමට හේතු විය.
- ඒ අනුව, පාරිභෝගික, අන්තර් සහ ආයෝජන භාණ්ඩ යන සියලුම ප්‍රධාන ආනයන කාණ්ඩ 2020 වසරේ මාර්තු මාසයේ දී අඩු විය. බොරතෙල් (2020 වසරේ මාර්තු මාසයේ දී සාමාන්‍ය ආනයන මිල බැරලයට එ.ජ.ඩොලර් 37.7), පිරිපහදු කළ ඛනිජ තෙල් සහ ගල් අඟුරු සඳහා වූ සාමාන්‍ය ආනයන මිල ගණන් පහළ යෑම ප්‍රධාන වශයෙන් හේතු කොටගෙන ඉන්ධන ආනයන වියදම අඩු විය. බොර තෙල් හැර අනෙකුත් ඉන්ධන ආනයන පරිමා ද පහත වැටුණි. යන්ත්‍රසූත්‍ර හා උපකරණ, රෙදිපිළි හා රෙදිපිළි උපාංග, ගොඩනැගිලි ද්‍රව්‍ය, පොහොර සහ රසායනික නිෂ්පාදිත ආනයන වියදම් ද සැලකිය යුතු ලෙස පහළ ගියේය. මෙයට අමතරව, ආනයන සීමා කිරීම්වලට යටත් වූ පෞද්ගලික රථවාහන, විදුලි සන්දේශ මෙවලම් සහ ගෘහ උපකරණ ආනයන ද 2020 මාර්තු මාසයේ දී පහළ ගියේය. කෙසේ වෙතත්, 2020 මාර්තු මාසයේ දී තිරිඟු, එළවළු, (ප්‍රධාන වශයෙන් ලොකු ළූණු සහ අර්තාපල්) සීනි, කුළුබඩු (ප්‍රධාන වශයෙන් මිරිස්) සහ මුහුදු ආහාර (ප්‍රධාන වශයෙන් ටින් මාළු සහ කරවල) වැනි අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම් ඉහළ ගියේය. මෙයට අමතරව, අන්තර් භාණ්ඩ යටතේ වර්ග කර ඇති මූල ලෝහ (ප්‍රධාන වශයෙන් යකඩ සහ වානේ) සහ රබර් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත ද 2019 වසරේ මාර්තු මාසයට සාපේක්ෂව 2020 වසරේ මාර්තු මාසයේ දී ඉහළ ගියේය.
- 2020 වසරේ මාර්තු මාසයේ දී ආනයන පරිමා දර්ශකය සහ ආනයන මිල දර්ශකය පිළිවෙළින් සියයට 18.4කින් සහ සියයට 14.6කින් පහත වැටුණු අතර, 2019 වසරේ මාර්තු මාසයට සාපේක්ෂව ආනයන පහළ යෑම සඳහා ආනයන පරිමා සහ මිල ගණන් දෙඅංශයේම පහළ යෑම හේතු වූ බව මෙමගින් පිළිබිඹු වේ.

**රූප සටහන 6: මාසික ආනයන ක්‍රියාකාරීත්වය**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 7: මාසික ආනයන පරිමා දර්ශකය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 3: වෙළඳ භාණ්ඩ ආනයන වියදම (අ)**

| භාණ්ඩය | 2019 මාර්තු (එ.ජ. ඩොලර් මිලියන) | 2020 මාර්තු (එ.ජ. ඩොලර් මිලියන) | වෙනස (%) | 2019 ජන.- මාර්තු (එ.ජ. ඩොලර් මිලියන) | 2020 ජන.- මාර්තු (එ.ජ. ඩොලර් මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | **351.9** | **267.1** | **-24.1** | **912.3** | **966.1** | **5.9** |
| ආහාර හා පාන වර්ග | 138.0 | 143.0 | 3.6 | 334.9 | 426.4 | 27.3 |
| ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 2.5 | 2.0 | -20.3 | 9.7 | 11.9 | 23.7 |
| කිරි නිෂ්පාදිත | 40.6 | 32.5 | -20.0 | 64.6 | 96.8 | 49.9 |
| එළවළු | 27.2 | 38.8 | 42.4 | 71.7 | 104.7 | 46.0 |
| මුහුදු ආහාර | 17.0 | 17.8 | 4.3 | 50.3 | 46.7 | -7.3 |
| සීනි හා රසකැවිලි | 20.0 | 27.2 | 36.0 | 48.9 | 73.1 | 49.5 |
| කුළුබඩු | 10.4 | 11.2 | 8.0 | 29.1 | 34.9 | 19.7 |
| වෙනත් ආහාර හා පාන වර්ග | 20.3 | 13.6 | -32.9 | 60.7 | 58.4 | -3.8 |
| ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 213.8 | 124.0 | -42.0 | 577.4 | 539.7 | -6.5 |
| පෞද්ගලික රථවාහන | 72.2 | 39.5 | -45.3 | 169.8 | 156.4 | -7.9 |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 44.1 | 34.4 | -22.1 | 121.8 | 125.4 | 3.0 |
| ගෘහ උපකරණ | 20.5 | 10.9 | -46.7 | 50.2 | 50.6 | 0.8 |
| රෙදිපිළි හා උපාංග | 22.5 | 15.2 | -32.4 | 75.1 | 73.2 | -2.5 |
| විදුලි සන්දේශ මෙවලම් | 22.8 | 7.4 | -67.5 | 61.6 | 48.7 | -21.0 |
| ගෘහ හා දැව භාණ්ඩ | 11.2 | 6.9 | -38.5 | 35.9 | 37.8 | 5.3 |
| වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 20.6 | 9.8 | -52.4 | 63.0 | 47.6 | -24.3 |
| **2. අන්තර් භාණ්ඩ** | **987.1** | **699.7** | **-29.1** | **2,774.2** | **2,545.7** | **-8.2** |
| ඉන්ධන | 407.9 | 237.7 | -41.7 | 1,018.6 | 948.2 | -6.9 |
| එයින් බොරතෙල් | 101.9 | 54.6 | -46.4 | 237.7 | 194.9 | -18.0 |
| පිරිපහදු කළ ඛනිජතෙල් | 271.5 | 153.1 | -43.6 | 659.0 | 649.7 | -1.4 |
| ගල් අඟුරු | 34.5 | 29.9 | -13.1 | 122.0 | 103.6 | -15.1 |
| දියමන්ති, අගනා ගල් හා ලෝහ වර්ග | 14.7 | 5.4 | -63.1 | 47.7 | 25.7 | -46.1 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 213.9 | 139.3 | -34.9 | 688.6 | 622.0 | -9.7 |
| කඩදාසි හා ඝන කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 34.1 | 20.4 | -40.2 | 103.7 | 90.9 | -12.4 |
| කෘෂිකාර්මික යෙදවුම් | 17.6 | 14.5 | -17.4 | 45.4 | 50.8 | 12.1 |
| තිරිඟු හා ඉරිඟු | 12.0 | 62.5 | 419.3 | 53.2 | 79.8 | 49.9 |
| මූල ලෝහ | 34.6 | 52.6 | 52.0 | 140.8 | 98.2 | -30.2 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 47.4 | 32.0 | -32.5 | 143.7 | 126.9 | -11.7 |
| රසායනික නිෂ්පාදිත | 70.9 | 52.0 | -26.7 | 207.4 | 190.5 | -8.1 |
| පොහොර | 39.3 | 6.7 | -83.1 | 48.4 | 25.9 | -46.5 |
| රබර් සහ ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 16.8 | 20.5 | 22.3 | 52.4 | 67.5 | 28.7 |
| වෙනත් අන්තර් භාණ්ඩ | 77.8 | 56.1 | -27.9 | 224.4 | 219.2 | -2.3 |
| **3. ආයෝජන භාණ්ඩ** | **389.3** | **236.8** | **-39.2** | **1,128.8** | **983.8** | **-12.8** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 213.9 | 130.2 | -39.1 | 639.0 | 572.4 | -10.4 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 135.0 | 72.7 | -46.2 | 375.7 | 294.4 | -21.6 |
| ප්‍රවාහන උපකරණ | 39.5 | 33.7 | -14.8 | 112.3 | 116.1 | 3.4 |
| වෙනත් ආයෝජන භාණ්ඩ | 1.0 | 0.2 | -77.1 | 1.8 | 0.9 | -51.0 |
| **4. වර්ග නොකළ ආනයන** | **0.7** | **1.5** | **99.8** | **1.6** | **7.1** | **355.1** |
| **මුළු ආනයන** | **1,729.0** | **1,205.0** | **-30.3** | **4,816.9** | **4,502.7** | **-6.5** |
| **ඉන්ධන නොවන ආනයන** | **1,321.2** | **967.4** | **-26.8** | **3,798.3** | **3,554.5** | **-6.4** |

(අ) තාවකාලික

මූලයන් : ශ්‍රී ලංකා රේගුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා අයි.ඕ.සී. සමාගම, ශ්‍රී ලංකා මහ බැංකුව

## ජංගම ගිණුම වෙත වාර්තා වූ අනෙකුත් ප්‍රධාන ලැබීම්

- කොවිඩ්-19 වසංගතය හේතුවෙන් 2020 මාර්තු මාසයේ සිට ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය දැඩි බලපෑමට ලක් විය. ශ්‍රී ලංකාවට පැමිණෙන සියලුම මගී ගුවන් යානා සහ නැව් නවතාලීමත් සමඟ 2020 මාර්තු තුන්වන සතියේ සිට **සංචාරක පැමිණීම්** නැවැත්වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස සංචාරක පැමිණීම් 2019 මාර්තු මාසයේ දී වාර්තා වූ 244,328 සිට 2020 මාර්තු මාසයේ දී 71,370ක් දක්වා සියයට 70.8 කින් අඩු විය.
- මෙම ප්‍රවණතා සමඟ, **සංචාරක ඉපැයීම්** 2019 මාර්තු මාසයේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 461 සමඟ සැසඳීමේ දී 2020 මාර්තු මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 135ක් දක්වා අඩු වී ඇතැයි තාවකාලිකව ඇස්තමේන්තු කර ඇති අතර, 2020 වසරේ පළමු මාස තුන තුළ දී සමුච්චිත සංචාරක ඉපැයීම් 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 956ක් දක්වා සියයට 31.5කින් අඩු විය.
- මේ අතර, 2020 මාර්තු මාසයේදී **විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ** එ.ජ. ඩොලර් මිලියන 492ක් දක්වා පෙර වසරේ අනුරූප කාලයට සාපේක්ෂව සියයට 13.9කින් අඩු විය. 2020 මාර්තු මාසයේ දී ගුවන් තොටුපළ වසා දැමීමට පෙර දකුණු කොරියාව සහ ඉතාලිය යනාදී රටවලින් ආපසු පැමිණි විදේශ සේවා නියුක්තිකයින් සැලකිය යුතු ප්‍රමාණයක් විය. බොරතෙල් මිල අඩු වීම ශ්‍රී ලාංකික සංක්‍රමණික සේවා නියුක්තිකයින් බහුතරයක් සේවය කරන මැද පෙරදිග ආර්ථිකයන් කෙරෙහි බලපෑම හේතුවෙන් මෙම තත්ත්වය තවදුරටත් උග්‍ර විය. 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදය සමඟ සැසඳීමේ දී සමුච්චිත පදනම මත විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ එ.ජ. ඩොලර් මිලියන 1,600ක් දක්වා සියයට 1.0කින් අඩු විය.

**රූප සටහන 8: සංචාරක පැමිණීම්හි ප්‍රධාන මූලාශ්‍ර**




මූලය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

**රූප සටහන 9: සංචාරක ඉපැයීම් සහ විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ**




මූලයන්: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, බලපත්‍රලාභී බැංකු, ශ්‍රී ලංකා මහ බැංකුව

## මූල්‍ය ලැබීම්

- 2020 වසරේ මාර්තු මාසයේ දී රුපියල්වලින් නාමනය කරන ලද **රාජ්‍ය සුරැකුම්පත්** වෙළඳපොළෙහි වූ විදේශීය ආයෝජන එ.ජ. ඩොලර් මිලියන 261ක ශුද්ධ ගෙවීමක් වාර්තා කිරීම හේතුවෙන්, සමුච්චිත පදනම මත, 2020 වසරේ පළමු මාස තුන තුළ දී රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් එ.ජ. ඩොලර් මිලියන 361ක ශුද්ධ ගෙවීමක් වාර්තා විය. කොවිඩ්-19 වසංගතයෙන් පසු බොහෝ නැගී එන සහ ප්‍රමුඛ ආර්ථිකයන්ගේ බැඳුම්කර වෙළඳපොළවලින් විදේශ ආයෝජන ඉවත් කර ගැනීම් දක්නට ලැබුණි. කෙසේ වෙතත්, නොපියවා ඉතිරිව ඇති රාජ්‍ය සුරැකුම්පත්වලින් අනේවාසිකයින් සතුව පවතිනුයේ ඉතා සුළු කොටසක් පමණක් බැවින් එවැනි විදේශ ආයෝජන ඉවත් කරගැනීම්වලට ශ්‍රී ලංකාව නිරාවරණය වීම පහළ මට්ටමක පවතී.
- ද්විතීයික වෙළඳපොළ ගනුදෙනුවලින් පමණක් සමන්විත වූ **කොළඹ කොටස් වෙළඳපොළෙහි** විදේශීය ආයෝජන 2020 වසරේ මාර්තු මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 6ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය. කොළඹ කොටස් වෙළඳපොළ 2020 වසරේ මාර්තු මැද සිට මැයි මැද දක්වා වසා දමා තිබුණි. සමුච්චිත පදනම මත, 2020 වසරේ පළමු මාස තුන තුළ දී කොළඹ කොටස් වෙළඳපොළ එ.ජ. ඩොලර් මිලියන 28ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය.
- 2020 වසරේ මාර්තු මාසයේ දී රජය වෙත වූ **දිගු කාලීන දළ ණය ලැබීම්** එ.ජ. ඩොලර් මිලියන 588ක් වූ අතර, ඒ තුළ චීන සංවර්ධන බැංකුවෙන් ලද එ.ජ. ඩොලර් මිලියන 500ක ඒකාබද්ධ ණය පහසුකම හා සම්බන්ධ ලැබීම් ඇතුළත් විය.

## ජාත්‍යන්තර සංචිත

- 2020 වසරේ මාර්තු මාසයේ දී දළ නිල **සංචිත** ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියන 7.5ක් වූ අතර, එය ආනයනික මාස 4.6කට සමාන විය. දළ නිල සංචිත සහ බැංකු අංශයේ විදේශීය වත්කම්වලින් සමන්විත වන මුළු විදේශීය වත්කම් ප්‍රමාණය 2020 වසරේ මාර්තු මස අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 10.7ක් වූ අතර, එය ආනයනික මාස 6.5කට සමාන විය.

**රූප සටහන 10: දළ නිල සංචිත සහ සංචිත ප්‍රමාණාත්මකභාවය**






මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## විනිමය අනුපාතිකයේ හැසිරීම

- 2020 වසරේ මාර්තු මස දෙවන සතිය දක්වා පුළුල් ලෙස ස්ථාවරව පැවති ශ්‍රී ලංකා රුපියල, කොවිඩ්-19 වසංගතය පැතිරීමත් සමඟ 2020 වසරේ මාර්තු මස අග භාගයේ සිට අප්‍රේල් මැද දක්වා සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වූ අතර, 2020 වසරේ අප්‍රේල් 09 වැනි දින එ.ජ. ඩොලරයට රුපියල් 199.75ක ඉහළම අගයට ළඟා විය. කෙසේ වුවත්, එතැන් සිට රුපියල ස්ථාවර වූ අතර, 2020 වසරේ මැයි මාසය තුළ දී සැලකිය යුතු අතිප්‍රමාණය වීමක් වාර්තා කළේය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2020 වසරේ අප්‍රේල් මස 09 වැනි දින දක්වා එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 9.1කින් අවප්‍රමාණය වූ රුපියල එම ප්‍රවණතාව වෙනස් කරමින් සැලකිය යුතු ලෙස අතිප්‍රමාණය වූ අතර, 2020 වසරේ ජූනි මස 01 වැනි දින වන විට සියයට 2.4ක අවප්‍රමාණය වීමක් වාර්තා කළේය. අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම පිළිබිඹු කරමින් 2020 වසරේ ජූනි 01 වැනි දින දක්වා වූ කාලපරිච්ඡේදය තුළ දී රුපියල, යුරෝ සහ ජපන් යෙන්වලට සාපේක්ෂව අවප්‍රමාණය වූ අතර, ස්ටර්ලින් පවුම, කැනේඩියානු ඩොලරය, ඕස්ට්‍රේලියානු ඩොලරය සහ ඉන්දියානු රුපියලට සාපේක්ෂව අතිප්‍රමාණය විය.

**රූප සටහන 11: එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියලෙහි අගය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 4: තෝරාගත් ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි වෙනස්වීම**

| මුදල් ඒකකය | 2018 | 2019 | 2020 ( ජූනි 01 දක්වා) අවප්‍රමාණය (-)/ අතිප්‍රමාණය (+) |
|---|---|---|---|
| එ.ජ. ඩොලරය | -16.4% | +0.6% | -2.4% |
| යුරෝ | -12.7% | +2.6% | -1.7% |
| ස්ටර්ලින් පවුම | -11.4% | -2.8% | +3.2% |
| ජපන් යෙන් | -18.1% | -1.0% | -3.3% |
| කැනේඩියානු ඩොලරය | -9.3% | -3.7% | +2.5% |
| ඕස්ට්‍රේලියානු ඩොලරය | -7.6% | +1.3% | +1.6% |
| ඉන්දියානු රුපියල | -8.7% | +2.6% | +3.1% |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව